"ශීඝ්‍ර එන්නත්කරණයේ ලොව පළමු තැන ලංකාවට" යන සිරස්තලය ඔස්සේ මව්බිම පුවත්පතේ (08/01) පුවත් වාර්තාවක් පළවී තිබිණි. එසේම මෙම පුවතම මව්බිම සහෝදර ඉංග්‍රීසි පුවත්පත වන Ceylon Today හි පළවී තිබුණේ, "'Our World in Data' notes SL tops Vaccine rollout fior two days" යන සිරස්තලය යටතේයි. මෙම පුවත් දෙකම එකක් වුවත්, පුවත් වාර්තාවන් දෙකේ වෙනස වූයේ මව්බිම පුවත් වාර්තාවේ එම දත්ත ලබාගත්තේ කොතැනකින් දැයි කිසිදු මූලාශ්‍රයක් දැක්වී නොතිබීමත්, Ceylon Today පුවත් වාර්තාවේ එම දත්ත ලබාගත් මූලාශ්‍රය නිවැරදිව දැක්වී තිබීමත් වේ.

වාර්තාකරණයේදී මූලාශ්‍ර යොදාගැනීම ඔස්සේ යම් පුවත් වාර්තාවක දැක්වෙන දත්ත හෝ තොරතුරු වල විශ්වසනීයත්වය සැලකිය යුතු ලෙසින් ඉහළ නැංවෙන බැව් නොකිවමනායි.

ඒ අනුව බලන විට, මව්බිම ප්‍රවෘත්තියේ විශ්වසනීයත්වය මූලාශ්‍ර සඳහන් නොවීම හේතුවෙන් හීන වී නොමැතිද? අනෙක් අතට නිසි මූලාශ්‍ර සහිතව ඉදිරිපත් කොට ඇති Ceylon Today ප්‍රවෘත්තිය වඩාත් විශ්වසනීය ආකාරයකින් ඉදිරිපත් වී ඇති, වඩාත් සම්පූර්ණ වාර්තාකරණයක් නොවන්නේද?

**#MediaEthicsSL #lka #sinhalanews #Mawbima #CeylonToday**